*සැ. යු.-* 2018.04.12 දින පළ වූ අංක 2067 දරන *ගැසට් පත්‍රයේ* III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,068 - 2018 අප්‍රේල් මස 20 වැනි සිකුරාදා - 2018.04.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 838 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 844 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 මැයි මස 11 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 අප්‍රේල් මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

## තනතුරු - ඇබෑර්තු

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

උප්පැන්න හා මරණ සහ විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු
රත්නපුර දිස්ත්‍රික්කය

**අයදුම්පත් කැඳවීමේ දැන්වීම අවලංගු කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2064 දරන 2018.03.23 *ගැසට්* පත්‍රයේ I වන කොටසේ (II අ) වැනි ඡේදයේ මා විසින් පළකරන ලද රත්නපුර දිස්ත්‍රික්කයේ උප්පැන්න, මරණ හා විවාහ, අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ නිවේදනයේ පහත සඳහන් කොට්ඨාසයේ පමණක් අයදුම්පත් කැඳවීම අවලංගු කරමි.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවූ කොට්ඨාසය හා තනතුර* |
|---|---|---|
| රත්නපුර | රත්නපුර | නවදුන් කෝරළය කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය |

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 අප්‍රේල් මස 03 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ 3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

04 - 671

---

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

උප්පැන්න හා මරණ සහ විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු
රත්නපුර දිස්ත්‍රික්කය

**අයදුම්පත් කැඳවීමේ දැන්වීම අවලංගු කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1978 දරන 2016.07.29 දිනැති *ගැසට්* පත්‍රයේ I වන කොටසේ (II අ) වැනි ඡේදයේ මා විසින් පළකරන ලද රත්නපුර දිස්ත්‍රික්කයේ විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ නිවේදනයේ පහත සඳහන් කොට්ඨාසයේ පමණක් අයදුම්පත් කැඳවීම අවලංගු කරමි.

***උපලේඛනය***

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* |
|---|---|---|
| රත්නපුර | ඉඹුල්පේ | බලංගොඩ මූලික රෝහල් කොට්ඨාසයේ උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර් ධූරය |

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 අප්‍රේල් මස 03 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ 3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

04 - 672

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

උප්පැන්න හා මරණ සහ විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු
කොළඹ දිස්ත්‍රික්කය

**අයදුම්පත් කැඳවීමේ දැන්වීම අවලංගු කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2064 දරන 2018.03.23 *ගැසට් පත්‍රයේ* I වන කොටසේ (II අ) වැනි ඡේදයේ මා විසින් පළකරන ලද කොළඹ දිස්ත්‍රික්කයේ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ නිවේදනයේ පහත සඳහන් කොට්ඨාසයේ පමණක් අයදුම්පත් කැඳවීම අවලංගු කරමි.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* |
|---|---|---|
| කොළඹ | මහරගම | අපේක්ෂා රෝහල් කොට්ඨාසයේ උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර් ධුරය |

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 අප්‍රේල් මස 03 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ 3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

04 - 673

## සංශෝධනයයි
## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර සංශෝධනය කිරීම - ගාල්ල දිස්ත්‍රික්කය

අංක 2065 හා 2018.03.29 වැනි දිනැති *ගැසට්* පත්‍රයෙහි මවිසින් පළ කරන ලද දැන්වීමෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන විවාහ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර කිරිදිඇල කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා වැල්ලබඩපත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය ලෙස සංශෝධනය කරමි.

02. එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බව ද කරුණාවෙන් සලකන්න.

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 අප්‍රේල් මස 03 වැනි දින,

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගාල්ල | ගෝනාපීනුවල | කිරිදිඇල කොට්ඨාසයේ උප්පැන්න මරණ හා වැල්ලබඩ පත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |

04 - 674

---

## සංශෝධනයයි
## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය සහ විවාහ කොට්ඨාසය සංශෝධනය කිරීම - නුවරඑළිය දිස්ත්‍රික්කය

අංක 2064 හා 2018.03.23 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ *ගැසට් පත්‍රයේ* නිවේදනය කර තිබූ පහත උපලේඛනයේ සඳහන් තනතුරට අදාළ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2018.05.21 වැනි දින දක්වා දීර්ඝ කෙරෙන අතර විවාහ කොට්ඨාසය වලපනේ ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරමි.

02. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය හා විවාහ කොට්ඨාසය පමණක් නිවැරදි විය යුතු අතර, එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බව ද කරුණාවෙන් සලකන්න.

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| නුවරඑළිය | වලපනේ | පල්ලේගම්පහ දකුණ කොට්ඨාසයේ උප්පැන්න මරණ හා වලපනේ කොට්ඨාසයේ විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය. |

04 - 670

## අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

## රාජ්‍ය නැටුම් කණ්ඩායමේ නැටුම් ශිල්පී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නැටුම් කණ්ඩායමේ පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට පහත දැක්වෙන සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදසියක පිළියෙල කළ අයදුම්පත් 2018.05.31 දින හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "නැටුම් ශිල්පී (කොන්ත්‍රාත් පදනම මත)" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙම දැන්වීම www.culturaldept.gov.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබා ගත හැකි ය.

01. *සේවයේ නියුක්ත කරවීම සහ සේවා කොන්දේසි* :

I. කොන්ත්‍රාත් පදනමින් පත් කරනු ලබන අතර වසර 03 ක කොන්ත්‍රාත් කාලයක් සඳහා පත් කෙරේ.
II. වැටුප රු. 33,600/- ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

02. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* :

I. අධ්‍යාපන සුදුසුකම් :
අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ දී නර්තන විෂය ඇතුළුව විෂයයන් තුන (03) කින් සමත් වීම.
හා
ජාතික නැටුම් මධ්‍යම හෝ අවසාන විභාගය සමත්වීම හෝ හාත්ඛණ්ඩේ විද්‍යා පීඨයේ නෘත්‍ය විශාරද විභාගය සමත්වීම.
හෝ
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන නර්තන විෂයය සම්බන්ධව උපාධියක් ලබා තිබීම.

II. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ
(යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී වෘත්තීය සුදුසුකම් අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ)

III. පළපුරුද්ද :
රජයේ අනුමත කලායතනයක හෝ ඊට සමාන ආයතනයක නැටුම් ශිල්පියෙකු වශයෙන් වසර 05 ක පළපුරුද්ද.
හෝ
පාරම්පරික නර්තන ශිල්පියෙකු වීම. (ලිඛිතව සනාථ කළ යුතු ය)

IV. කායික සුදුසුකම් :
i. සැම අපේක්ෂකයෙක්ම තනතුරෙහි රාජකාරි ඉටුකිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
ii. උස අඩි 5 යි අඟල් 3 කට නොඅඩු විය යුතු ය.

V. වෙනත් සුදුසුකම් :
i. සියළුම අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
ii. තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
iii. නර්තන/ වාදන සියළුම අංශවල ප්‍රවීනතාවය සළකනු ලැබේ.

03. *වයස් සීමාව* : අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය* :

- යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.
- යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලැබේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් සහ වෘත්තීය පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ. |
| 2. අදළ ක්ෂේත්‍ර තුළ ලබා ඇති පළපුරුද්ද (සහතික මගින් සනාථ කළ යුතුය) | 35 | |
| 3. වෘත්තීය සුදුසුකම්<br>i. ප්‍රවීණ ශිල්පීන් යටතේ ජාතික තලයේ නිර්මාණවලට සහභාගී වී තිබීම.<br>ii. සංස්කෘතික මධ්‍යස්ථාන මගින් හෝ ප්‍රවීණ ශිල්පීන් සමගින් විදේශ ප්‍රසංගවලට සහභාගී වී තිබීම | 25 | |
| 4. භාෂා ප්‍රවීණතාවය | 15 | |
| 5. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා | 05 | |
| එකතුව | 100 | |

වෘත්තීය පරීක්ෂණය :

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. ශිල්පීය දක්ෂතාව | 30 | 15 |
| 2. රේඛා හැඩතල සහ තාල ඥානය | 20 | 10 |
| 3. පෙනුම (උස/ මහත) | 20 | 10 |
| 4. විශේෂ කුසලතා | 20 | 10 |
| 5. න්‍යායාත්මක දැනුම | 10 | 05 |
| එකතුව | 100 | 50 |

05. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*

අයදුම්පත්‍ර පිරවීමේ දී අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර නිවැරදිව ඇතුළත් කළ යුතු අතර යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය

06. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

07. අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත්කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

08. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

අනූෂා ගෝකුළ ප්‍රනාන්දු,
අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

2018 අප්‍රේල් මස 06 වැනි දින,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
08 වන මහළ, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

*ආදර්ශ අයදුම් පත්‍රය*

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ නැටුම් ශිල්පී (කොන්ත්‍රාත් පදනම මත) තනතුර සඳහා ඉල්ලුම් කිරීම

01. මුලකුරු සමඟ නම :————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
03. උපන් දිනය:
04. වයස (2018.05.31 දිනට) : අවුරුදු :————. මාස :————. දින :————.
05. උස : අඩි :————. අඟල් :————.
06. ජාතික හැඳුනුම්පත් අංකය :————.
07. ස්ත්‍රී/ පුරුෂ භාවය :————.
08. ලිපිනය :
09. දුරකථන අංකය :————.
10. අධ්‍යාපන සුදුසුකම් :————.

i. අ.පො.ස. (උ./ පෙළ)
වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයය | ලබාගත් සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

ii. ලබාගත් උපාධිය :————.

| වලංගු වන දිනය | ක්ෂේත්‍රය | ආයතනය / විශ්ව විද්‍යාලය |
|---|---|---|
| | | |
| | | |

iii. ජාතික නැටුම් මධ්‍යම හෝ අවසාන විභාගය/ භාත්ඛණ්ඩේ විද්‍යා පීඨයේ නෘත්‍ය විශාරද විභාගය

| වලංගු වන දිනය | සමත් විභාගය | ආයතනය / විශ්ව විද්‍යාලය |
|---|---|---|
| | | |
| | | |

11. වෘත්තීය සුදුසුකම් :

12. පළපුරුද්ද :

මෙම අයදුම්පත්‍රයේ මවිසින් සපයා ඇති සියලු තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවද, මෙහි සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට ප්‍රථම දැනගනු ලැබුවහොත් මා නුසුදුස්සකු වන බවත් පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කළ හැකි බවත් මම දනිමි.

අයදුම්කරුගේ අත්සන :————.

දිනය :————.

04 - 797

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

### ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය ඉංජිනේරු තාක්ෂණ ආයතනය කටුනායක

### ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ඉංජිනේරු විද්‍යා විශේෂ ආධුනිකයින් බඳවා ගැනීම - 2018 කණ්ඩායම

කටුනායක, ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාව, 2018 කණ්ඩායම සඳහා ඉංජිනේරු විද්‍යා විශේෂ ආධුනිකයින් බඳවා ගැනීම පිණිස ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *ඇතුලත් කර ගැනීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :*

පහත දක්වා ඇති සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

1.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාග යේදි විද්‍යාව, ගණිතය සහ ස්වභාෂාව යන විෂයයන් තුන (03) සඳහා සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබීම.

සහ

1.2 නාවික ඉංජිනේරු පාඨමාලාව හැර අනෙක් සියලුම පාඨමාලා සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදි ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිම.

නාවික ඉංජිනේරු පාඨමාලාව සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදි ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම අනිවාර්‍ය වේ.

සහ

1.3 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදි සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන් තුන (03) එකවර සමත් වීම.

හෝ

1.4 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදි සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයයන් තුන (03) එකවර සමත් වීම. (මෙහිදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ප්‍රධාන විෂයයක් ලෙස සමත් ව තිබිය යුතුය.)

2. *වයස* - 2018/12/31 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 25 ට නොවැඩි විය යුතුය.

3. *පුහුණු කිරීමේ කාලය පිළිබඳ වැඩසටහන් විස්තර :*
මෙම පාඨමාලාවේ කාලය වසර හතරකි. මාස 18 ක න්‍යායික උපදෙස් පාඨමාලාව, මාස 30 ක ප්‍රායෝගික පුහුණුව සමග පහත දැක්වෙන ආකාරයට සකස් කර ඇත.

මූලික න්‍යායික උපදෙස් වැඩසටහන ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ දී - මාස 06
මූලික කර්මාන්ත පුහුණුව බාහිර පුහුණු ආයතන වලදී - මාස 12
සාමාන්‍ය න්‍යායික උපදෙස් වැඩසටහන ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ දී - මාස 06
සාමාන්‍ය කර්මාන්ත පුහුණුව බාහිර පුහුණු ආයතන වලදී - මාස 12
විශේෂ න්‍යායික උපදෙස් වැඩසටහන ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ දී - මාස 06
විශේෂ කර්මාන්ත පුහුණුව බාහිර පුහුණු ආයතන වලදී - මාස 06

මෙම ඉංජිනේරු පාඨමාලාවට අයත් න්‍යායික උපදෙස් හා පාඨමාලා ප්‍රායෝගික කාර්යයන් මෙම ආයතනයේ දී ලබා දෙන අතර, කාර්මාන්ත පුහුණුව පිළිගත් කර්මාන්ත ආයතන මගින් ලබා දෙනු ඇත. පාඨමාලාව ආරම්භයේදී ඉංග්‍රිසි පාඨමාලාවක් පවත්වනු ලබන අතර එයට සියළුම ආධුනිකයින්ගේ සහභාගිත්වය අනිවාර්ය වේ.

4. ආයතනය මගින් පවත්වනු ලබන පාඨමාලා පහත සඳහන් පරිදි වේ.

අ. සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය
1. සිවිල් - ගොඩනැගිලි සහ ව්‍යුහ ඉංජිනේරු පාඨමාලාව
2. සිවිල් - මහාමාර්ග සහ දුම්රිය මාර්ග ඉංජිනේරු පාඨමාලාව
3. සිවිල් - ජල සහ පාරිසරික ඉංජිනේරු පාඨමාලාව

ආ. විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රය
1. විදුලි - විද්‍යුත් හා සන්නිවේදන ඉංජිනේරු පාඨමාලාව
2. විදුලි - විදුලි බල ඉංජිනේරු පාඨමාලාව

ඇ. යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රය
1. යාන්ත්‍රික - ස්වයංචලන ඉංජිනේරු පාඨමාලාව
2. යාන්ත්‍රික - යාන්ත්‍රික (සාමාන්‍ය) ඉංජිනේරු පාඨමාලාව
3. යාන්ත්‍රික - නාවික ඉංජිනේරු පාඨමාලාව

❖ ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ නාවික ඉංජිනේරු පාඨමාලාව, **ISO** 9001:2015 තත්ව සහතිකය යටතේ පැවැත්වේ.

❖ නාවික ඉංජිනේරු පාඨමාලාව සැලසුම් කොට ඇත්තේ අන්තර්ජාතික සමුද්‍ර සංවිධානයේ **STCW-95** සහ **7.04** ආදර්ශ පාඨමාලාව හා සම්බන්ධිත නාවික ඉංජිනේරු කාරක මට්ටමේ දැනුම, අවබෝධය සහ ප්‍රවීණතාව පිළිබඳ විධානානුකූල අවශ්‍යතා සපුරාලනු පිණිස වේ.

5. *පාඨමාලා මාධ්‍යය* - මෙම පාඨමාලා පවත්වනු ලබන්නේ ඉංග්‍රිසි භාෂාවෙනි.

6. *ආධුනිකත්ව ගිවිසුම* :

6.1 තෝරාගනු ලබන සෑම ආධුනිකයෙකු විසින්ම ආධුනිකයා සහ පුහුණු වන ආයතනය යන දෙදෙනා වෙත අන්‍යෝන්‍ය වගකීම් පැවරෙන විශේෂ ආධුනිකත්ව ගිවිසුමකට ඇතුල් විය යුතු අතර, පාඨමාලාවට ලියාපදිංචි වන අවස්ථාවේ දී නැවත ආපසු ගෙවනු ලබන රු. 5000/- ක තැන්පතු මුදලක් ලබා දිය යුතුය. මෙම තැන්පත් මුදල ආපසු ලබා ගත හැක්කේ ලියාපදිංචියෙන් සති දෙකක් ඇතුලත පාඨමාලාවෙන් ඉවත් වන විට හෝ පාඨමාලාව සාර්ථකව අවසන් කළ පසු පමණි.

6.2 සමෘද්ධි සහනාධාර හිමි පවුලක සාමාජිකයකු නම් ඊට අදාළ මුල් පිටපත් (සමෘද්ධි කාඩ්පත හා ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද ප්‍රාදේශිය ලේකම් විසින් සහතික කරන ලද ලිපිය) ඉදිරිපත් කිරීමෙන් ඉහත තැන්පත් මුදලින් නිදහස් විය හැක.

6.3 තෝරාගනු ලබන සෑම ආධුනිකයෙකුම පාඨමාලාවට ලියාපදිංචි වන අවස්ථාවේදී, ලියාපදිංචි ගාස්තු වශයෙන් රු. 500/- ක් හා පුස්තකාල සංවර්ධන අරමුදල සඳහා රු. 1000/- ක් වශයෙන් නැවත නොගෙවනු ලබන රු. 1500/- ක මුදලක් ආයතනය වෙත ගෙවිය යුතුය.

6.4 පුහුණුව අවසාන වීමෙන් පසුව ආධුනිකයින් සඳහා රැකියා සැපයීමට ආයතනය බැඳී නොමැත.

6.5 **මෙම පාඨමාලා සඳහා ලියාපදිංචි වන සියළුම සිසුන් මුළු පාඨමාලා කාලය තුළදී පැමිණීමේ ප්‍රතිශතය, ආයතනය මගින් නිකුත් කර ඇති සීමාවන්ට යටත්ව තබා ගත යුතු අතර** එසේ නොවන අවස්ථා වලදී අදාළ විභාග වලට පෙනී සිටිය නොහැකි අතර පාඨමාලාවෙන් ඉවත් විය යුතුවේ.

7. *සහතික ප්‍රදානය* :

සාර්ථක ලෙස න්‍යායික සහ ප්‍රායෝගික පුහුණුව අවසන් කර සමත්වන ආධුනිකයින් හට ආයතනයට ඇති සියලුම බැදීම් වලින් නිදහස් වූ පසු, ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා සහතිකය ප්‍රදානය කරනු ඇත.

8. *තෝරාගැනීමේ ක්‍රමය* -

8.1 ඉහත අංක 1 ඡේදයෙහි සඳහන් ඇතුළත් කරගැනීම සඳහා වූ අවම සුදුසුකම් සහිත අංක 2 ඡේදයෙහි සඳහන් වයස සීමාව තුළ වූ අයදුම්කරුවන්ගෙන් පහත දැක්වෙන ක්‍රමයට තෝරාගැනීම සිදුකරනු ලැබේ.

8.2 මූලික සුදුසුකම් සපුරා ඇති සියලුම අයදුම්කරුවන් ඉංග්‍රිසි මාධ්‍යයෙන් වූ ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. (ලිඛිත යෝග්‍යතා පරීක්ෂණය - සඳහා සුදුසුකම් ලබන සියලුම අයදුම්කරුවන් වෙත කල් වේලා ඇතිව ඒ බව දැනුම් දෙනු ලැබේ) .

8.3 ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව, කුසලතාවය මත සීමිත අයඳුම්කරුවන් පිරිසක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

8.4 ලිඛිත පරීක්ෂණයෙන් සහ සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා මුළු ලකුණු පදනම් කොට ගෙන පාඨමාලාව සඳහා ආධුනිකයින් තෝරාගනු ඇත.

8.5 **තෝරා ගනු ලැබූ සියළුම අයඳුම්කරුවන් ඔවුන් එම ක්ෂේත්‍රයේ ලියාපදිංචි වීමට පෙර ඔවුන්ගේ වියදමින් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය. (නාවික ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා තෝරා ගනු ලැබූ සියළුම අයඳුම්කරුවන් එම ක්ෂේත්‍රයේ ලියාපදිංචි වීමෙන් පසු ඔවුන්ගේ වියදමින් නැවතත් විශේෂ වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය).**

9. *අයඳුම්පත්* -

9.1 ඔබගේ අයඳුම්පත් සමග අ.පො.ස (සා.පෙළ) සහ අ.පො.ස (උ.පෙළ) අධ්‍යාපන සහතිකවල විදුහල්පති විසින් සහතික කරන ලද පිටපත එවීම අනිවාර්ය වේ. එසේ නොමැති අයඳුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලියාපදිංචි වීමට තෝරා ගනු ලැබූ අයඳුම්කරුවන්ගේ අ.පො.ස (සා.පෙළ) සහ අ.පො.ස (උ.පෙළ) අධ්‍යාපන සහතිකවල පිටපත විභාග දෙපාර්තමේන්තුවෙන් නිරවද්‍යතාව පරීක්ෂා කරනු ලැබේ. එහි වියදම ඔවුන් විසින් දැරිය යුතුය.

9.2 සෑම අයඳුම්කරුවෙකු විසින්ම තම අයඳුම්පත ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් පරිදි නැවත නොගෙවන ගෙවීමක් විභාග ගාස්තු ලෙස (9.3 ප්‍රකාර) ගෙවිය යුතුය. මෙම ගෙවීම දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවිය හැකිය.

(a). රු.200/-ක් ගෙවා ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ කාර්යාලයකින් ලබාගත් අයඳුම්පතක් ඉදිරිපත් කරන්නේ නම් ගෙවීම රු. 550/-කි.

(b). වෙබ් අඩවියෙන් හෝ වෙනත් ආකාරයකින් ලබාගත් අයදුම්පතක් සඳහා ගෙවීම රු. 750/-කි.

9.3 මුදල් තැන්පතු තුණ්ඩුව පහත සඳහන් කරුණු සහිතව නිසි පරිදි සම්පූර්ණ කළ යුතුය.
 (i) ශාඛා අංකය සහ ගිණුම් අංකය - 276-1-001-8-6351396.
 (ii) බැර උපදෙස් - මහජන බැංකුව, කටුනායක, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ රැස් කිරීමේ ගිණුම් අංක 276-1-001-8-6351396. ට බැර පිණිස.
 (iii) අයදුම්කරුගේ නම සහ ලිපිනය

9.4 අයදුම්පත් සහ ආයතනය පිළිබඳ වැඩි විස්තර www.iet.edu.lk යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

9.5 කටුනායක, පන්සල පාරේ, ඉංජිනේරු තාක්ෂණ ආයතනයට පැමිණ රු.200/- ක් ගෙවීමෙන් හෝ තැපෑලෙන් අවශ්‍ය නම් රු.200/- ක් වටිනා මුදල් ඇණවුමක් සහ අදාළ වටිනාකම සහිත මුද්දර ගැසූ ලිපිනය ලියන ලද අඟල් 9 × 4 ප්‍රමාණයේ ලියුම් කවරයක් ලේඛකාධිකාරී, ඉංජිනේරු තාක්ෂණ ආයතනය, පන්සල පාර, කටුනායක යන ලිපිනයට 2018 මැයි 04 ට පෙර එවීමෙන් අයදුම්පත් ලබාගත හැක. මුදල් ඇණවුම ගණකාධිකාරී, - ඉංජිනේරු තාක්ෂණ ආයතනය නමින් ලබාගත යුතු අතර ගෙවීම් කරන තැපැල් කාර්යාලය "කටුනායක" විය යුතුය.
(☎ 011-2252833:011-2252834:011-2254667)

9.6 ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියෙන් හැර වෙනත් පෞද්ගලික ආයතනවලින් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබයි.

9.7 මුදල් ගෙවීම් කරන ලද බැංකු ශාඛාවේ බලයලත් නිලධාරියෙකු විසින් සහතික කරන ලද තැන්පතු රිසිට්පත, අයදුම්පතේ අලවා නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත, 2018 මැයි 31 වන දින හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යක්‍ෂ/විදුහල්පති, ඉංජිනේරු තාක්ෂණ ආයතනය, පන්සල පාර, කටුනායක යන ලිපිනයට එවිය යුතුය. කවරයේ වම්පස කෙළවරේ "විශේෂ ආධුනිකයන් බඳවා ගැනිම - 2018" ලෙස සටහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හෝ අතින් ගෙනැවිත් භාර දෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

9.8 රජයේ කාර්මික ආයතනයක හෝ විශ්ව විද්‍යාලයක පූර්ණ කාලීන ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ උපාධිය, හැදෑරූ හෝ හදාරමින් සිටින අයට මේ සඳහා අයදුම් කළ නොහැක.

9.9 අයදුම්පත් ලැබුණු බවට අයදුම්කරුවන්ට දැනුම් දෙනු නොලැබේ.

9.10 මෙයට අමතරව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ පහත දැක්වෙන කාර්යාල වලට පැමිණ රු.200/- ක් ගෙවීමෙන්ද 2018 මැයි 31 වන දින දක්වා අයදුම්පත් මිලදී ගත හැක.

(i) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.
☎ 011-2888782-7

(ii) කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය, 581, ගාලුපාර, කටුබැද්ද, මොරටුව.
☎ 011-2647393,011-2643356

(iii) මෝටර්රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය, 69/A, ඩැනිස්ටර් ද සිල්වා මාවත, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය.
☎ 011-2572977, 011-2532182

(iv) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 10/4, මල්වත්ත පාර, බදුලුපිටිය, බදුල්ල.
☎ 055-2230644

(v) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 642, විද්‍යාල මාවත, නව නගරය, රත්නපුර.
☎ 045-2228667

(vi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, 27 ඒ, විවෘත විශ්වවිද්‍යාල මාවත, නූපේ, මාතර.
☎ 041-2226958

(vii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 108/2B, තිවංක බෝධි මාවත, මහනුවර.
☎ 081-2201918

(viii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, ගුවන්තොටුපල පාර, අනුරාධපුරය.
☎ 025-2223178

(ix) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, මීගමුව පාර, මල්කඩුවාව, කුරුණෑගල.
☎ 037-2223789

(x) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 44, සෝමසුන්දරම් පාර, චුන්ඩික්කුලි, යාපනය.
☎ 021-2222383

(xi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 07, ග්‍රාමසේවක පටුමඟ, කල්මුනේ කුඩි 13, කල්මුනේ.
☎ 067-2229357

(xii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 242, හැව්ලොක් පාර, කොළඹ 05.
☎ 011-2597671,011-2587258

(xiii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 326/2, ප්‍රධාන වීදිය, කළුතර දකුණ.
☎ 034-2224239

(xiv) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 61/5, මිනුවන්ගොඩ පාර, ගම්පහ.
☎ 033-2232874

(xv) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, මෝලවත්ත,මැදගම පාර, මාදම්පෙ.
☎ 032-2248250

(xvi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 103/ වාරිමාර්ග පෙදෙස, නව නගරය, පොළොන්නරුව.
☎ 027-2223023

(xvii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, කච්චේරිය සංකීර්ණය, මොණරාගල.
☎ 055-2276504

(xviii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 116, කෝවිල පාර, හාවා එළිය, නුවරඑළිය.
☎ 052-2223702

(xix) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 11, පන්සල පාර, මණ්දන්ඩාවල, මාතලේ.
☎ 066-2223173

(xx) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක මාවත, බල්ලපාන, ගලිගමුව නගරය, කෑගල්ල.
☎ 035-2284931

(xxi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 395, වක්වැල්ල පාර, ජුල් ගහ, ගාල්ල.
☎ 091-2235628

(xxii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 39, පල්ලික්කුඩාව පාර, තංගල්ල.
☎ 047-2241512

(xxiii) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, මාන්කුලම් පාර,මුල්ලියාවලයි,මුලතිව්.
☎ 021-2061012

(xxiv) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, A9 පාර, ආනන්දපුරම්, කිලිනොච්චිය.
☎ 021-2285615

(xxv) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 103/7, තැපැල් කාර්යාලය පාර, ත්‍රිකුණාමලය.
☎ 026-2226569

(xxvi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 294, නොච්චිමුනෙයි, මඩකලපුව.
☎ 065-2228130

(xxvii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, ඕෆ් ෆාර්ක් පාර, වවුනියාව.
☎ 024-2224679

(xxviii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 952/1, පරණ මූර් වීදිය, නල්ලයාර් වීදිය, මන්නාරම.
☎ 023-2223404

10. තැපැලේදී නැතිවන හා ප්‍රමාද වන අයදුම්පත් සම්බන්ධයෙන් ඉංජිනේරු තාක්ෂණ ආයතනය වග කියනු නොලැබේ. ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා කල් ඇතිව සිය අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ට විශේෂයෙන් දන්වා සිටිනු ලැබේ.

ශෙහාන් සෙනෙවිරත්න,
සභාපති,
ජාතික ආධුනිකත්ව හා
කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

අංක 971,ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ,
රාජගිරිය.

04-564

---

## අල් - ආලිම් සහතික පත්‍ර විභාගය

(අ) 2013 හා ඉන් අනතුරුව ක්‍රියාත්මක වන සේ 2012 වසරේ ජනවාරි මස 20 වන දින විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රකාශයට පත් කරන ලද අල් - ආලිම් විභාග සඳහා වූ ව්‍යවස්ථා හා විෂය නිර්දේශ, මෙම නිවේදනයේ සඳහන් වන ආකාරයට ප්‍රතිසංස්කරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

අල් ආලිම් සහතික පත්‍ර විභාග පටිපාටිය
2013 සහ ඉන් පසුව

ඉහත විභාගය මට්ටම් දෙකකින් පැවැත්වේ.

1. අල්-ආලිම් මුතවස්සිතා පත්‍ර විභාගය
2. අල්- ආලිම් සානවියියා සහතික පත්‍ර විභාගය

ඉහත විභාග දෙක සඳහා වූ නිර්ණායක හා රෙගුලාසි

01. ඉහත විභාග අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් ඔහුගේ උපදෙස් මත විභාග කොමසාරිස් ජනරාල් විසින් වාර්ෂිකව පවත්වනු ලැබේ. අවශ්‍යතාව අනුව මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ උපදෙස් ලබාගනු ඇත.

02. අල් - ආලිම් සහතික පත්‍ර විභාගය 2016 වර්ෂයේ සිට ද, පැවැත්වේ.

03. මාධ්‍ය භාෂාව.- මෙම විභාගය අරාබි භාෂාවෙන් පැවැත්වේ. පරිවර්තනය හැර අන් සියලු ප්‍රශ්නවලට අරාබි භාෂාවෙන් පිළිතුරු ලිවිය යුතුය. පරිවර්තන ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා තුනෙන් එකක් පමණක් අපේක්ෂකයාට තෝරා ගත හැකිය.

04. සුදුසුකම්

4.1 මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අරාබි විදුහලක තුන් අවුරුදු පාඨමාලාව සම්පූර්ණ කළ අය, අල් - ආලිම් මුතවස්සිතා විභාග යටත්, පස් අවුරුදු පාඨමාලාව සම්පූර්ණ කළ අය ''අල්-ආලිම් සානවියියා'' විභාගයටත් පෙනී සිටීමට සුදුසුකම් ලැබූ අය වෙති.

නැතහොත්

4.2 ඉහත අරාබි විදුහලක පාඨමාලාව හදරන ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක විභාගයට පෙනී සිටීමට සුදුසු යැයි එහි විදුහල්පති තීරණය කරන විටක එම ශිෂ්‍යයා/ශිෂ්‍යාව ඉහත විභාග දෙකටම පෙනී සිටීමට සුදුසුකම් ලබයි. දෙපිරිසම අරාබි විදුහලේ අපේක්ෂකයන් වශයෙන් විභාගයට පෙනී සිටිය හැකිය.

4.3 අරාබි විදුහලක අධ්‍යාපනය නොලබන අයෙකු, පෞද්ගලික අයදුම්කරු වශයෙන් ආසන්න අරාබි විදුහලක් මගින් විභාගයට පෙනී සිටිය යුතුය.

4.4 අල්- ආලිම් මුතවස්සිතා සහතික පත්‍ර විභාගය සමත් වූවන් අල්- ආලිම් සානවියියා සහතික පත්‍ර විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

4.5 අල්- ආලිම් මුතවස්සිතා සහතික පත්‍ර විභාගය සමත් නොවූ අයෙකුට අල්- ආලිම් සානවියියා සහතික පත්‍ර විභාගයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කළ නොහැක.

05. විභාගය සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අරාබි විදුහල්වලට විභාග ඉල්ලුම් පත්‍ර සහ උපදෙස් තැපැල මගින් යවනු ලැබේ. ඉල්ලුම්පත්‍ර හා උපදෙස් නොලැබුණු අරාබි විදුහල්, විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනයෙන් ඉල්ලුම් පත්‍ර හා උපදෙස් ලබා ගත හැකිය.

5.1 සියලු අයදුම්පත් පිටපත් දෙකකින් පිළියෙල කර, ඉන් එක් පිටපතක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු අතර, දෙවන පිටපත ඉල්ලුම් පත්‍ර එවන අරාබි විදුහලේ ගොනු කර තැබිය යුතුය.

5.2 අයදුම්පත් පැහැදිලිව හා නිවැරදිව සම්පූර්ණ කළ යුතුය. එසේ සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් සහ අවසාන දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

5.3 අයදුම්පත් භාරගන්නා අවසාන දිනය *ගැසට් පත්‍රය* මගින් හෝ පුවත්පත් දැන්වීම මගින් හෝ ඉල්ලුම්පත් කැඳවීමේ දී දන්වනු ලැබේ.

5.4 සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්,<br>
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,<br>
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,<br>
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503,<br>
කොළඹ.

6.1 පළමුවතාවට පෙනී සිටින අරාබි විදුහල් අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු අය නොකෙරේ. දෙවන වතාවට පෙනී සිටින අයදුම්කරුවන් ද පෞද්ගලික අයදුම්කරුවන්ද විභාග ගාස්තු ගෙවිය යුතුය.

6.2 විභාග ගාස්තු ගෙවන ආකාරය
නියමිත මුදල තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පත සමග අමුණා එවිය යුතුය.

විභාග ගාස්තු ප්‍රමාණය හා එම ගාස්තු ගෙවන ආකාරය කලින් කලට අවශ්‍යතාව මත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් දන්වනු ලැබේ.

07. විභාග ප්‍රවේශ පත්‍ර, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් විභාගය සඳහා ඉල්ලුම් කළ අරාබි විදුහලේ විදුහල්පති වෙත නිකුත් කෙරේ.

7.1 සෑම විභාග අයදුම්කරුවෙකුම විභාගයට පෙනී සිටින පළමුවන අවස්ථාවේදීම විභාග ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත භාරදිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වූ විට ඔහුගේ/ඇයගේ විභාග අපේක්ෂත්වය අවලංගු වීමට ඉඩ ඇත.

7.2 අරාබි විදුහල් අයදුම්කරුවන්ගෙන් අත්සන අදාළ අරාබි විදුහලේ විදුහල්පති විසින් ප්‍රවේශ පත්‍රයේ සහතික කර තිබිය යුතුය.

08. අනන්‍යතාව තහවුරු කිරීම
අයදුම්කරුවන් මත අනන්‍යතාව තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් ඉදිරිපත් කළ යුතුය.
(අ) ජාතික හැඳුනුම්පත
(ආ) වලංගු විදේස් ගමන් බලපත්‍රය

09. විභාග මධ්‍යස්ථාන පිහිටවනු ලබන නගර
i. නැගෙනහිර පළාත - ත්‍රිකුණාමලය, මඩකලපුව, කල්මුනේ, අක්කරයිපත්තුව,
ii. බස්නාහිර පළාත - කොළඹ, ගම්පහ, කළුතර

iii. දකුණු පළාත - ගාල්ල මාතර
iv. වයඹ පළාත - පුත්තලම, කුරුණෑගල
v. මධ්‍යම පළාත - මහනුවර, මාතලේ, නුවරඑළිය
vi. උතුරු මැද පළාත - අනුරාධපුරය, පොළොන්නරුව
vii. ඌව පළාත - බදුල්ල, මොණරාගල
viii. සබරගමු පළාත -මාවනැල්ල, රත්නපුරය, කෑගල්ල
ix. උතුරු පළාත - වවුනියාව, මන්නාරම, යාපනය

ඉහත සඳහන් නගරයන්හි පිහිටුවීමට නියමිත විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් ඉල්ලුම්කර නොමැති අවස්ථාවක එම අයදුම්කරුවන් ආසන්න නගරයක පිහිටුවන විභාග මධ්‍යස්ථානයකට යොමු කරනු ලැබේ. අවශ්‍යතාව අනුව යම් නගරයක විභාග මධ්‍යස්ථාන නොපිහිටුවීමට හා වෙනත් නගරවල විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් පියවර ගනු ඇත.

10. උත්තර පත්‍ර නැවත සමීක්ෂණය :
විභාග ප්‍රතිඵල නිකුත්වී දින තිහක් තුළ විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ආකෘති පත්‍රය මගින් ආයතනයේ විදුහල්පති ඉල්ලුම් කළහොත් අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන්ගේ උත්තර පත්‍ර නැවත සමීක්ෂණය සඳහා අවස්ථාව දෙනු ලැබේ. මේ සඳහා ගාස්තුවක් අය කෙරේ. විභාග ප්‍රතිඵලයේ සංශෝධනයක් වේ නම් ගාස්තුව ආපසු දෙනු ලැබේ.

11. අල් - ආලිම් මුතවස්සිතා සහතික පත්‍ර විභාගය (වර්ෂ 2013 සහ ඉන්පසුව)

විභාග විස්තර
මෙම විභාගය පහත සඳහන් විෂයයන් හය සඳහා වූ පැය තුනක ප්‍රශ්න පත්‍ර හයකින් සමන්විතය.

| | |
|---|---|
| (1) අල්-ලුහතුල් අරබියියා වල් අදබ් (1) | - අරාබි භාෂාව හා සාහිත්‍යය (1) |
| (2) අල් - කුර්ආනුල් කරීම් | -අල්-කුර්ආනුල් කරීම් |
| (3) අල් - හදීසුන් නබවි | - නබි වාක්‍ය |
| (4) අල්- ෆික්හුල් ඉස්ලාම් | - ඉස්ලාමීය නීති මාලාව |
| (5) අත්- තර්බියා අල් - ඉස්ලාමියියා | - ඉස්ලාමීය සාරධර්ම |
| (6) අත්තාරීහුල් ඉස්ලාම් | - ඉස්ලාමීය ඉතිහාසය |

12. විෂය නිර්දේශය :

1 අල් -ලුහතුල් අරබියියා වල් අදබ් (1) - (අරාබි භාෂාව හා සාහිත්‍යය) (1)

මෙහිදී අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව, සිතුවිලි සහ අදහස් සංවිධානය කර ගැනීමේ ක්‍රම ආදිය පරීක්ෂාවට ලක් කෙරේ. රචනා ලිවීම, ව්‍යාකරණ සහ භාෂාව භාවිතය, කලින් සඳහන් නොවූ කොටස් පරිවර්තනය කිරීම ආදිය පරීක්ෂා කෙරේ.

මේ සඳහා නිර්දේශිත ග්‍රන්ථ,
(අ) අල්-අරබිය්යතු - ලින් - නාෂිරීන් 1 2, 3, කොටස්. කතෘවරු - මහ්මුද් - ඉස්මායිල් සීනි, නාසිෆ්, මුස්තාෆා අබ්දුල් අසීස් මුක්තාර්, තාහිර් හුසෙයින්
(ආ) මජ්මූඅතුන් නහ්වු - මීසාන් අජ්නාස්, තක්වීමුල් ලිසාන්, අල් අවාමිල් යන කොටස්
(ඇ) ''මුදම්මිමතුල් ආජුරුමියියා'' මුහම්මද් ඉබිනු මුහම්මද් අර්රජිනි
(ඈ) අන්නහ්වුල් - වාලිහ් අල්- මර්හලා අල් ඉබ්තිදාඉයියා - ජුස්උ 1.2.3 අලී- ජාසිම්, මුස්තාෆා අමීන්

2. අල් - කුර්ආනුල් කරීම් -
* ජුස්උ අම්ම වන පොත් කිරීම : තජ්වීද් ක්‍රම හා පරිවර්තනය ඇතුලුව පාරායනය කිරීම
* අල්-කුර්ආනය පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් තිබීම එහි කෙටි අර්ථය දැන සිටීම සහ තජ්වීද් නීති පිළිබඳ අවබෝධය

මේ සඳහා නිර්දේශිත ග්‍රන්ථ

(අ) හිදායතුල් මුස්තෆීද් - අෂ් ෂෙයික් මහ්මුදුල් මහ්මුද්
(ආ) තෆ්සීර් අල් - ජලාලයින්- ඉමාම් ජලාලුද්දීන් අස් - සුයුති - ජුස්උ අම්ම වනපොත් කිරීම -තජ්වීද් ක්‍රමය හා පරිවර්තනය ඇතුලුව

3. අල් - හදීසුන් නබවි - නබි වාක්‍ය
- නීති මූලාශ්‍රයක් වශයෙන් හදීස් පිළිබඳ පොදු විග්‍රහය
- හදීස් අර්ථ විග්‍රහය
- තෝරාගත් හදීස් වනපොත් කිරීම,
- හදීස්වලින් නීති විග්‍රහ ලබාගැනීම ආදිය

මෙම ප්‍රශ්න පත්‍රයෙන් පරීක්ෂාවට ලක් කෙරේ.

මේ සඳහා නිර්දේශිත ග්‍රන්ථ
(අ) අල්-අර්බඋනන් නවවිය්යා - ඉමාම් නවවී (රහ්)
(ආ) සාදුත් තාලිබීන් - මෞලානා මුහම්මද් ආෂික් ඉලාහි''

4. අල් ෆික්හුල් ඉස්ලාම් - ඉස්ලාමීය නීති මාලාව
- ඉස්ලාමීය නීති මාලාව පිළිබඳ දැනුම හා අවබෝධය සහ
- කලින් කලට ඇතිවන ගැටළු සඳහා නීතිමය විසඳුම් ලබා ගැනීමේ හැකියාව පරීක්ෂා කෙරේ.

මේ සඳහා නිර්දේශිත ග්‍රන්ථ

මත්නු අබීෂුජාඃ - අල් කාලි අබීෂුජාඃ අහ්මද් ඉබිනු හුසෙයින් අහ්මද් අල් ඉස්ෆහානි

5. අත් - තර්බියතුල් ඉස්ලාමිය්යා - ඉස්ලාමීය සාරධර්ම
ඉස්ලාමීය සාරධර්ම, විනය පද්ධති සහ පිළිවෙත් මෙයින් පරීක්ෂා කෙරේ.

මේ සඳහා නිර්දේශිත ග්‍රන්ථ
(අ) තඃලීමුල් මුතඅල්ලිම් - බුර්හානුල් ඉස්ලාමී අස්සර්නූජී
(ආ) හිස්නුල් මුස්ලිම් - සර්ද් ඉබිනු අලී - ඉබිනු වහ්බ් අල් ගහ්තානි

6. අත්තාරිහුල් ඉස්ලාම් - ඉස්ලාමීය ඉතිහාසය
ජාහිලියා යුගය පිළිබඳ විස්තරාත්මක දැනුම
මුහම්මද් (සල්) තුමාගේ උපතේ පටන් වෆාතන දක්වා ඉතිහාසය
කුලෆා උර් රාෂිදීන්- කුලෆාවරුන්ගේ ගතිගුණ, සාධනය, පාලන ක්‍රමය, රාජධානිය ව්‍යාප්ත වීම.

මේ සඳහා නිර්දේශිත ග්‍රන්ථ ඃ

තාරිල් ඉස්ලාම් - හසන් ඉබ්රාහිම් හසන්

13. ප්‍රශ්න පත්‍ර ව්‍යුහය ඃ

සෑම ප්‍රශ්න පත්‍රයක්ම I හා II වශයෙන් කොටස් දෙකකින් යුක්තය. I කොටස කෙටි පිළිතුරු බලාපොරොත්තුවන ව්‍යුහගත, අනිවාර්යය ප්‍රශ්න 10 කින් සමන්විතය. එක් ප්‍රශ්නයකට ලකුණු 4 බැගින් 1 කොටසට ලකුණු 40 ක් හිමි වේ.

II කොටස මෙය රචනාමය ප්‍රශ්නයකින් හා අර්ධ ව්‍යුහගත ප්‍රශ්න හයකින් සමන්විතය. රචනාමය ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. මෙම ප්‍රශ්නයකට ලකුණු 20 ක් හිමිවේ. අර්ධ ව්‍යුහගත ප්‍රශ්න හයකින් කැමති ප්‍රශ්න හතරකට පිළිතුරු ලිවිය හැකිය. එහි එක් එක් ප්‍රශ්නය (අ) සහ (ආ) යන උපකොටස් දෙකකින් යුක්ත වේ. එක් උප කොටසකට ලකුණු 5 බැගින් එක් ප්‍රශ්නයකට ලකුණු 10 ක් හිමිවේ.

14. සාමාර්ථතාව තීරණය කිරීමේ නිර්ණායක
එක් එක් ප්‍රශ්න පත්‍ර සඳහා වූ මුළු ලකුණු සංඛ්‍යාව 100 කි. සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 35 ක් ලබා ගත යුතුය.

| | | *ලකුණු* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| අ | - | 00-34 දක්වා | W |
| ආ | - | 35-49 දක්වා | S |
| ඇ | - | 50-64 දක්වා | C |
| ඈ | - | 65-74 දක්වා | B |
| ඉ | - | 75-100 දක්වා | A |

අල්-ආලිම් මුතවස්සිතා සහතික පත්‍ර විභාගයේ සියලු විෂයයන්ගෙන් සමත්වී අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාග යේ භාෂාව (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) ගණිතය, ඇතුළුව අවම වශයෙන් විෂයයන් හයකින් සමත් වන්නන් සඳහා,

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් අල්-ආලිම් මුතවස්සිතා සහතිකය පිරිනමනු ලැබේ. එහෙත් සියලු විභාග අපේක්ෂකයින්ට වෙන වෙනම ප්‍රතිඵල ලේඛනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් නොකෙරේ.

15. විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සහ සාමාර්ථතාව තීරණය කිරීම
අල්-ආලිම් මුතවස්සිතා සහතික පත්‍ර විභාගයෙන් නියමිත විෂයයන් හය සමත්වන්නන් විභාග සමතුන් ලෙස සැලකේ. එක් විෂයකින් පමණක් අසමත් වූ විට ඌනසාමාර්ථය ලැබූ සේ සලකනු ලැබේ. එසේ ඌනසාමාර්ථය ලබන අයදුම්කරුවන් අනුගාමී විභාග වාර දෙකක් ඇතුළත විභාගයට පෙනී සිට එම විෂය සමත් වුවහොත් අල්-ආලිම් මුතවස්සිතා විභාගය සමත්වූවන් සේ සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයකු මුතවස්සිතා සහතිකය ලබා ගැනීම සඳහා, මෙම විභාගය සමත්වන අතරම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් පවත්වනු ලබන අ.පො.ස. (සා.පෙ) විභාගයේ භාෂාව (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) හා ගණිතය සහිතව අවම වශයෙන් විෂයයන් හයකින් සමත් වී තිබිය යුතුය. මෙම විභාග දෙකම සමත් වන අයට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් මුතවස්සිතා සහතිකය පිරිනමනු ලැබේ. නියමිත පරිදි අයදුම් කිරීමෙන් එම සහතිකය ලබා ගත හැකිය.

16. අල් - ආලිම් සානවියියා සහතික පත්‍ර විභාගය - (2015 සහ ඉන් පසු)

විභාග පිළිබඳ විස්තර

මෙම විභාගය එක් එක් විෂයය සඳහා පැය තුනක ප්‍රශ්න පත්‍රය බැගින් ප්‍රශ්න පත්‍ර හයකින් සමන්විතය. එම විෂයයන් පහත සඳහන් වේ.

7. අල් - ලුහතුල් අරබිය්යා වල් අදබ් II - අරාබි භෂාව හා සාහිත්‍ය II
8. අල් කුර්ආන් වඋලුමුහු - කුර්ආනය හා කුර්ආනයට අදාළ කලාවන්
9. අල් - හදිස් වඋලුමුහු - හදිස් හා හදිස්වලට අදාළ කලාවන්
10. අල් - ෆික්හුල් ඉස්ලාම් වඋසුලුහු - ඉස්ලාමීය නීති මාලාව හා එහි පදනම
11. අල්- හලාරතුල් ඉස්ලාමිය්යා - ඉස්ලාමීය ශිෂ්ඨාචාරය
12. අල් - අකීදතුල් ඉස්ලාමිය්යා - ඉස්ලාමීය විශ්වාසය පිළිබඳ සිද්ධාන්ත

17. විෂය නිර්දේශය ඃ

1. අල් ලුහතුල් අරබියියා වල් අදබ් II (අරාබි භාෂාව හා සාහිත්‍යය II)
අදහස් හා සිතුවිලි සංවිධානය කර ප්‍රකාශ කිරීමේ හැකියාව, අරාබි භාෂාව, සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි හෝ භාෂාවට පරිවර්තනය කිරීමේ හැකියාව ආදිය පරීක්ෂා කෙරේ. අයිනුල් හුද බි ෂර්හි කත්රින් නද ග්‍රන්ථයේ මට්ටමට සරිලන අරාබි ව්‍යාකරණ දැනුම ද, පෙළපොතේ සඳහන් නොවන කොටස් පරිවර්තනය කිරීමේ හැකියාව ද, සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි හෝ භාෂාවෙන් අරාබි භාෂාවට පරිවර්තනය කිරීමේ හැකයාව ද, පෙළපොතේ සඳහන් සාහිත්‍ය ගුණාංග පිළිබඳ කරුණු ද පරීක්ෂාවට ලක් කෙරේ.

මේ සඳහා නිර්දේශිත ග්‍රන්ථ
(අ) අල් - අරබිය්යතු - ලින් නාෂිර්න් 4, 5, 6, යන කොටස් කතෘවරු - මහ්මුද් ඉස්මායිල් සිනි නාසිර් මුස්තාෆා අබ්දුල් අසීස් මුක්තාර් තාහිර් හුසෙයින්
(ආ) අල් - කිරාඅතුර් - රාෂිද 3 කොටස (1-15 පාඩම්) අබුල් - හසන් අලි (නද්වි)
(ඇ) අන් - නහ්වුල් වාලිහ් අල් මර්හලා (සානවිය්යා) 1, 2, 3 අලි අල් - ජාසිම් මුස්තාෆා අමීන්
(ඉ) අයිනුල් හුද ෆී ෂර්හි කත්රින් නදා - අෂ් - ෂෙයික් උස්මාන් අල්ෆන්නානි,

(ඊ) අල් - බලාහතුල් වාලිහා (කිස්මුල් බයාන් වල් බතීඋ) අලි - ජාසිම්, මුස්තාෆා අමීන්

2. අල් කුර්ආන් වඋලුමුහු - කුර්ආනය හා කුර්ආනයට අදාළ කලාවන් නියමිත සුරාහ්වන්හි අන්තර්ගත පිළිබඳ සවිස්තරාත්මක දැනුම ද, කුර්ආනිය කලාව පිළිබඳ අවබෝධය ද පරීක්ෂා කෙරේ.

මේ සඳහා නිර්දේශිත ග්‍රන්ථ

(අ) සෆ්වතුත් - තෆාසීර් : මුහම්මද් අලි අස් -සාබූනි අල් - මුල්ක්, අල් වාකිආ, අන්නූර්, අල් හුජුරාත්, අල් -කහ්ෆ්, යාසින් ආදී සූරාවන්

(ආ) අත්-තිබියාන් ෆි උලූමිල් කුර්ආන් - මුහම්මද් අලි - අස්සාබූනි

3. අල් - හදීස් වඋලූමුහු - හදීස් හා හිදීස්වලට අදළ කලාවන් නියමිත ග්‍රන්ථවල ඇති හදීස්වල අන්තර්ගතය. ඒවා ජීවිතයේ ක්‍රියාත්මක කරන ආකාරය, එහි ප්‍රයෝජන, ආදී කරුණු පරීක්ෂාවට ලක් කෙරේ. හදීස් කලාව පිළිබඳව පරිභාෂිත වචන, ඒවායේ අර්ථ, හදීස් සංරක්ෂණය සඳහා පැරැන්නන් කළ මෙහෙය හා දයකත්වය පිළිබඳ දැනුමද පරීක්ෂා කෙරේ.

මේ සඳහා නිර්දේශිත ග්‍රන්ථ,

(අ) බුලූහුල් - මරාම් - ඉබිනු හජර් අල් අස්කලානි (තහාරා පටන් නිකාහ් දක්වා වූ පරිච්ඡේද)

(ආ) මිෂ්කාතුල් -මසාබිහ් - අල් -ඉමාම් වලිය්යුද්දීන් අබූ අබ්දුල්ලාහ් මුහම්මද් ඉබිනු අබ්දුල්ලාහ් අල්-කතිබ් (රහ්) (අල් ඊමාන්, අල් - ඉ- තිසාම් බිල් කිතාබ් වස්සුන්නා, අල් - ඉල්මු, ෆලාඉලුල්, කුර්ආන් - අල් - අදබ් අලි -ෆිතන්, අල් - මනාකිබ්)

(ඇ) තයිසීර් මුස්තලහිල් හදීස් - මහ්මුද්, අත් තහ්හාන්

4. අල් - ෆික්හුල් ඉස්ලාම් ව - උසුලුහු (ඉස්ලාමීය නීති මාලාව හා එහි පදනම)

නියමිත ග්‍රන්ථ ආශ්‍රයෙන් ෆික්හු උසුලිල්ෆික්හි පිළිබඳ දැනුම හා ඒවා ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ අවබෝධය පරීක්ෂාවට ලක් කෙරේ.

මේ සඳහා නිර්දේශිත ග්‍රන්ථ

(අ) උම්දතුස් සාලික් ව උද්දතුන් නාසික් - ඉමාම් ෂබාබුද්දීන් අහමද් ඉබිනු අන් - නකීබ් අෂ්- ෂාෆිර්

(ආ) ෂරහුල් වරකාත් ෆී ඉල්මි උසුලිල් ෆික්හි ඉල්මි - ජලාලුද්දීන් මුහම්මද් ඉබිනු අහ්මද් අල් -මහල්ලි අෂ් - ෂාෆිර්

(ඇ) තස්හීලුල් වුසුල් ඉලා ෆහ්මි ඉල්මිල් - උසූල්

5. අල් - හළාරතුල් ඉස්ලාමියියා (ඉස්ලාමීය ශිෂ්ටාචාරය) නියමත ග්‍රන්ථ ආශ්‍රයෙන් උමෙයාවරුන්ගේ කාලයේ පටන් උස්මාන්වරුන්ගේ කිලාපත් බිඳවැටීමේ කාලය දක්වා වූ ඉස්ලාමීය ඉතිහාසය හා ඉස්ලාමීය ශිෂ්ටාචාරය පිළිබඳව පරීක්ෂා කෙරේ.

මේ සඳහා නිර්දේශිත ග්‍රන්ථ

(අ) අත්-තාරිකුල් - ඉස්ලාම් -ඉබ්‍රාහිම් බින් මහ්මුද් අබ්දුර් - රාලි

6. අල්-අකීදතුල් ඉස්ලාමියියා - ඉස්ලාමීය විශ්වාසය පිළිබඳ සිද්ධාන්ත නියමිත ග්‍රන්ථ ආශ්‍රයෙන් ඉස්ලාමීය අකිදාව පිළිබඳව දැනුම, අවබෝධය හා ජීවිතයේ භාවිත කිරිම පරීක්ෂාවට ලක් කෙරේ.

මේ සඳහා නිර්දේශිත ග්‍රන්ථ,

ජව්හරතුත් තව්හීද් : අල් - ඉමාම් ඉබ්‍රාහීම් අල්ලිකා ඉ
හෝ
අකීදතුත් තහාවියියා : අල් -ඉමාම් අබූ ජඋෆර් අහ්මද් ඉබිනු සලාමා අත් - තහාවි

18. ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

සෑම ප්‍රශ්න පත්‍රයක් ම I හා II වශයෙන් කොටස් දෙකකින් යුක්තය. 1 කොටස සියලු ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුයි. කෙටි පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න 10 කින් එය සමන්විතය. මෙම කොටසේ එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 4 බැගින් ප්‍රශ්න 10 ට මුළු ලකුණු 40 ක් හිමි වේ.

II කොටස මෙය රචනාමය ප්‍රශ්නයකින් හා අර්ධ ව්‍යුහගත ප්‍රශ්න හයකින් සමන්විතය. රචනාමය ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. මෙම ප්‍රශ්නයකට ලකුණු 20 ක් හිමිවේ. අර්ධ ව්‍යුහගත ප්‍රශ්න හයකින් කමැති ප්‍රශ්න හතරකට පිළිතුරු ලිවිය හැකිය. එහි එක් එක් ප්‍රශ්නය (අ) සහ (ආ) යන උපකොටස් දෙකකින් යුක්ත වේ. එක් උපකොටසකට ලකුණු 5 බැගින් එක් ප්‍රශ්නයකට ලකුණු 10 ක් හිමිවේ.

19. සාමාර්ථතාව තීරණය කරන නිර්ණායක

එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා වූ මුළු ලකුණු 100 කි. සමත්වීම සඳහා අවශ්‍ය අවම ලකුණු සංඛ්‍යාව 40 කි. මෙම විභාගයේ විෂයයන් හයම සමත් අයකු විභාගය සමත් ලෙස සැලකේ. විෂයයන් පහක් සමත්වී එක් විෂයක් පමණක් අසමත් වූ විට ඌනසමත් ලෙස සැලකේ. ඌණ සාමාර්ථය ලබන අයදුම්කරුවන් අනුගාමී විභාග වාර දෙකක් තුළ දී අසමත් වූ විෂය සමත් වීමෙන් සාමාර්ථතාව ලබාගත හැකිය. ශ්‍රේණි ගත කිරීම පහත ආකාරයට සිදුවේ.

| | | ලකුණු | ශ්‍රේණිය |
|---|---|---|---|
| අ | - | 00-39 දක්වා | W |
| ආ | - | 40-54 දක්වා | S |
| ඇ | - | 55-64 දක්වා | C |
| ඈ | - | 65-74 දක්වා | B |
| ඉ | - | 75-100 දක්වා | A |

සහතික පත්‍රය :

අල්-ආලිම් සානවියියා සහතිකපත්‍ර විභාගයෙන් හා සාමාන්‍ය ඉංග්‍රීසි, සාමාන්‍ය පොදු පරීක්ෂණය විෂයයන් හැර ඕනෑම

විෂයයන් තුනකින් සාමාර්ථ්‍යය ලබා අ.පො.ස. (උ/පෙ) විභාගයෙන් සමත්වන්නන්ට අල්-ආලිම් සානවියියා සහතික පත්‍රය පිරිනැමේ. නියමිත පරිදි ඉල්ලුම් කිරීමෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් අදාළ සහතිකය ලබාගත හැකිය. බාහිර අපේක්ෂකයන් ලෙස අල්-ආලිම් සානවියියා විභාගයට පෙනී සිටි අයට ප්‍රතිඵල ලේඛනයක් ලබා දෙනු ලැබේ.

අ.පො.ස. (උ/පෙ) විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබේ. එහි නීතිරීති හා කොන්දේසිවලට අනුව එයට පෙනී සිටිය හැකිය.

විභාග ප්‍රතිඵල නිකුත් කිරීම හා සාමාර්ථ්‍යතාවය තීරණය කිරීම

අල්-ආලිම් සානවියියා සහතික පත්‍ර විභාගයේ විෂයයන් හයක් සමත්වන්නන් විභාගය අසමත් අය ලෙස පිළිගනු ලැබේ. එක් විෂයයක් පමණක් අසමත් වූවත් ඌනසමත්වූවන් ලෙස සැලකේ. ඊළඟ විභාග වාර දෙකකදී එම විෂය සමත් වීමෙන් විභාගය සම්පූර්ණ කළ විට ඔවුන් විභාගය සමත් වූවන් ලෙස සැලකේ.

20. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් නිකුත් කර ඇති මෙම විභාග නිවේදනයෙහි භාෂා මාධ්‍යය අනුව වෙනසක් තිබුණි නම් දෙමළ භාෂාවෙන් ඇති විභාග නිවේදනය නිවැරදි සේ සැළකිය යුතුය.

21. මෙම විභාග සම්බන්ධයෙන් මෙහි සඳහන් නොවන කිසිවක් පිළිබඳව විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වන්නේ ය.

බී. සනත් පූජිත,
විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503,
කොළඹ,
2018 ක් වූ මාර්තු මස 26 වැනි දින.

04-582

---

## ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වන පන්තිය III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018

1.0 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වන පන්තියේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වන පන්තියේ III ශ්‍රේණියේ තනතුරු සඳහා තෝරා පත්කර ගනු ඇත.

3.0 මෙහිදී පිරවීමට අපේක්ෂිත මුළු පුරප්පාඩු සංඛ්‍යාව 911 කි. පත්වීම ක්‍රියාත්මක වන දිනය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිශ්චය කරනු ලැබේ. පුරවනු ලබන පුරප්පාඩු ප්‍රමාණය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

4.0 පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3% ක් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේදී සුදුසුකම් ලබන ආබාධ සහිත පුද්ගලයින් අතරින් ඉහළ ලකුණු මට්ටමේ 3% ක ප්‍රතිශතයක් පමණක් පත්වීම් ලබා දීම සඳහා තෝරා ගැනෙනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයන්ගේ ලකුණු මට්ටම යටත් පිරිසෙයින් මුළු ලකුණු ප්‍රමාණයෙන් 50% ක් වත් විය යුතුය. පත්වීමක් සඳහා තෝරාගනු ලැබූ අපේක්ෂකයකු විශේෂ වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත ඉදිරිපත් කරන අතර, අයදුම්කරු විශේෂඥ වෛද්‍ය වාර්තාවකින් තම අබාධ සහිත තත්ත්වය හා එය අදාළ තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා බාධාවක් නොවන බව තහවුරු කළ යුතුය.

5.0 *වැටුප* :- 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 (MT-01-2016) අනුව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3-III, 3-II හා 3-I වන ශ්‍රේණිවලට අදළ මාසික වැටුප් පරිමාණය රු. 29,840-10x300-11x350-10x560-10x660 - 48,890/- ක් වේ.

***සටහන*** : එම වැටුප ඔබට හිමිවන්නේ 2020.01.01 වැනි දින සිට වේ. එතෙක් ඉහත චක්‍රලේඛයේ II උපලේඛනයේ විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

6.0 මෙම තනතුර ස්ථිරය. මෙම විභාගයෙන් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වන පන්තියේ III ශ්‍රේණියට පත්වන නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට එම නිලධාරීන් යටත් වේ.

7.0 *සුදුසුකම්* :- ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වන පනතියේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය;
(*ආ*) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 2000.05.21 වැනි දිනට හෝ ඊට පෙර හා 1983.05.21 වැනි දිනට හෝ ඊට පසුව උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)
(*ඇ*) යහපත් චරිතයකින් සහ මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
(*ඈ*) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

(ඉ) *අධ්‍යාපන සුදුසුකම් :*

(01) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළුව සම්මාන පහක් (05) සහිතව විෂයයන් හයක් (06) <u>එකවර සමත් වීම.</u>

(ඊ) *වෘත්තීය සුදුසුකම් :*

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදළ ඩිප්ලෝමාව/ උසස් ඩිප්ලෝමාව හෝ ඊට ඉහළ පාඨමාලාවක් හදරා සම්පූර්ණ කර තිබීම.

*හෝ*

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන පරිගණක/ තොරතුරු තාක්ෂණ/ තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍රයට අදළ ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ පාඨමාලාවක් හෝ පැය 1500 කට නොඅඩු පාඨමාලාවක් හෝ හදාරා සම්පූර්ණ කර තිබීම;

*හෝ*

(ඇ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන එම කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති ආයතනයකින් හෝ පාර්ලිමේන්තුවේ සම්මත පනතක් මගින් ස්ථාපනය කර ඇති ව්‍යවස්ථාපිත ආයතනයකින්

(1) පරිගණක/ තොරතුරු තාක්ෂණ/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදළ ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05)/ඊට ඉහළ සහතිකය ලබා තිබීම;

*හෝ*

(2) පැය 1500 ට නොඅඩු පරිගණක/ තොරතුරු තාක්ෂණ/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදළ පාඨමාලාවක් හදරා සම්පූර්ණ කර තිබීම.

සෑම අයදුම්කරුවකුම තනතුරට අදළ සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දින හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

8.0 *විභාග පරිපාටිය :-*

8.1 විභාගය, ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත් වේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

8.2 විභාග විෂයයන් සහ ඒ ඒ විෂයයට වෙන් කෙරෙන ලද ලකුණු පහත දක්වේ.

| | | ලකුණු | කාලය |
|---|---|---|---|
| (i) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 100 යි | පැය 2 යි |
| (ii) | අභියෝග්‍යතාව | 100 යි | පැය 1 යි |
| | මුළු ලකුණු | 200 | |

<u>*තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ලිඛිත පරීක්ෂණය :*</u>

විභාග අපේක්ෂකයා සතු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳව සාමාන්‍ය දැනුම, මෙහෙයුම් පද්ධතීන්/ මෘදුකාංග/ දෘඩාංග පිළිබඳ දැනුම, වෙබ් හා අනෙකුත් තොරතුරු පද්ධති විශ්ලේෂණය, නිර්මාණය, පරීක්ෂාව, ස්ථාපනය හා නඩත්තු කටයුතු (System Analysis Design, Testing, Implementation and Maintenance) පිළිබඳ දැනුම, දත්ත සමුදාය (Database) නිර්මාණය හා කළමනාකරණය පිළිබඳ දැනුම, පරිගණක ජාල කළමනාකරණය පිළිබඳ දැනුම, අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල ආදී ක්ෂේත්‍ර පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන ව්‍යුහගත හා බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

*අභියෝග්‍යතාව :*

මෙම ප්‍රශ්න පත්‍රය විභාග අපේක්ෂකයාගේ සංඛ්‍යා ලේඛනාත්මක හැකියාව, තර්කානුකූල කරුණු දැක්වීම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න මෙම ප්‍රශ්න පත්‍රයට අඩංගු වේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිළියේ ප්‍රශ්න 50 කින් සමන්විතවන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

*සටහන :*

සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයන්ගේ යෝග්‍යතාව හා හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් වී ඇත. මෙම විභාගය තරග විභාගයක් වුව ද එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් (40%) සියයට හතළිහක්වත් අපේක්ෂකයන් විසින් ලබාගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් (50%) සියයට පනහක්වත් ලබාගත යුතු වේ. සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන් ඇපැහැදිළි අත් අකුරු හා වචනවලින් අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

8.3 පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඇතුළත් වන සේ විභාගය සමත් අපේක්ෂකයන්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛන විභාග කොමසාරිස් ජනරාල් විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබා දෙනු ඇත. එයට අමතරව විභාගයට පෙනී සිටි සියලුම අපේක්ෂකයන් වෙත එක් එක් විෂයය සඳහා ලබා ගත් ලකුණු, මුළු ලකුණු ඇතුළත් ප්‍රතිඵල ලේඛනයක් විභාග කොමසාරිස් ජනරාල් විසින් පෞද්ගලිකව ලබා දීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම සිදු කරනු ඇත.

9.0 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් - අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

10.0 *විභාග ගාස්තු* :- විභාග ගාස්තුව රු. 500/- කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003.02.13 ට බැරවන පරිදි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ගෙවිය හැකිය. ඒ සඳහා අයදුම්කරුගේ නමින් නිකුත් කරන රිසිට්පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ එහි දාරයකින් ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

11.0 (i) *අයදුම්පත්‍ර* :- ඒ4 (සෙ.මී. 21x29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදසි භාවිතා කරමින්,

(අ) අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමු පිටුවට ද,

(ආ) අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද, ඇතුළත් වන සේ කඩදසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය පිළියෙළ කරගත යුතු වන අතර අපේක්ෂකයා විභාගයට පෙනී සිටින භාෂාවෙන්ම අයදුම්පත්‍රයට පිරවිය යුතුය.

(ඇ) අයදුම්පත්‍රය පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැකිය.

(ii) මෙහි උපලේඛනය 1 අනුව විභාගයට පෙනී සිටින නගරය හා නගර අංකය කැමැත්ත අනුපිළිවෙළ අනුව පළමු හා දෙවන තේරීම වශයෙන් දැක්විය යුතුය. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. යම් නගරයකට ඉල්ලුම් කළ අපේක්ෂකයින් ගණන ප්‍රමාණවත් නොවේ නම් දෙවන කැමැත්ත ලෙස සඳහන් කළ නගරය වෙත යොමු කෙරෙන අතර, එම දෙවන නගරය සඳහා ද ප්‍රමාණවත් අපේක්ෂකයින් ගණනක් නොසිටියහොත් යාබද නගරයක් වෙත යොමු කරනු ලැබේ. කෙසේ වුව ද එකී මධ්‍යස්ථාන සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

11.1 *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ සැම අතින් ම සම්පූර්ණ අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට් නිවේදනය* අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

11.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වන පන්තියේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018" යන්න සඳහන් කරන්න.

11.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධරයකු, වාර්ෂික වැටුප රු. 240,360 ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන නිලධරයකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

11.4 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2018 මැයි මස 21 වන දින හෝ ඊට පෙර හෝ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය.
විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1503,
කොළඹ.

12.0 *විභාගයට පෙනී සිටීම* - අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහා ම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍ර නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත සහ ඉල්ලුම්පත්‍රය තැපෑලෙන් යොමු කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අතැතිව විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම්, ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීමට ඔබගේ ෆැක්ස් අංකය ද සමග ඉහත විස්තර ඇතුළත් ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කරමින් විමසා සිටීම ද වඩාත් ඵලදායී වනු ඇත.

13.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

14.0 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

15.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

16.0 මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් වේ නම් සිංහල නිවේදනය බලපැවැත්වේ.

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශය.

2018 අප්‍රේල් මස 06 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වන පන්තියේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018

Open Competitive Examination for Recruitment to Class 3 - Grade III of Sri Lanka Information & Communication Technology Service - 2018

(දෙන ලද කොටුව තුළ නිවැරදි සංකේතය/අංකය පැහැදිලිව සටහන් කරන්න).

☐
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.) දෙමළ - 3 ☐
ඉංග්‍රීසි - 4

- *ගැසට්* නිවේදනයේ 11(ii) ඡේදය අනුව ඉල්ලුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය හා නගර අංකය සඳහන් කරන්න. (විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර සහ නගර අංක සඳහා උපලේඛන - 1 බලන්න.)

| නගරය | නගර අංකය |
|---|---|
| පළමු තේරීම | |
| දෙවන තේරීම | |

- ඔබ විභාගයට පෙනී සිටින්නේ *ගැසට්* නිවේදනයේ 4.0 ඡේදයේ ප්‍රකාරව, ආබාධිත පුනරුත්ථාපන කොන්දේසි යටතේ ද? (මෙම කොටසේ "ඔව්" ලෙස සඳහන් කළ යුත්තේ ආබාධිත අයදුම්කරුවන් පමණක් වන බැවින් පිරවීමට පෙර *ගැසට්* නිවේදනයේ 4.0 ඡේදය හොඳින් කියවන්නේ නම් මැනවි.)

ඔව් - 1
නැත - 2 ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

1.0

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා : GUNAWARDHANA H.M.S.K

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

2.0

2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

3.0

3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0 ස්ත්‍රී - 1 [ ] (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 උපන් දිනය : වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

3.3 2018.05.21 දිනට වයස : අවුරුදු [ ][ ] මාස [ ][ ] දින [ ][ ]

3.4 ජංගම දුරකථන අංකය : | | | | | | | | | | |

4.0

4.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05 | | 10. | |

5.0 *වෘත්තීය සුදුසුකම් :*

(i) හදරා ඇති පරිගණක පාඨමාලාවේ නම :————.
(ii) පාඨමාලාව හදරා ඇති ආයතනය :————.
(iii) පාඨමාලාව සම්පූර්ණ කරන ලද දිනය :————.
(iv) පාඨමාලා කාලය :————.
(v) එම පාඨමාලාව ජාතික වෘත්තීය කුසලතා (NVQ 5) හෝ ඊට ඉහළ මට්ටමේ පාඨමාලාවක් නම් එම NVQ මට්ටම :————.
(vi) එම පාඨමාලාව පැය 1500ට නොඅඩු තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ පාඨමාලාවක් නම් එම පැය ගණන :————.

6.0 ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? ඔව් [ ] නැත [ ]
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.) (පිළිතුර "ඔව්" නම් විස්තර සඳහන් කරන්න.)
:————.

7.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය සහ දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

| |
|---|
| ලදුපත නොගැලවෙන ලෙස එහි එක් දරයකින් මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |

8.0 *අයදුම්කරුගේ සහතිකය* :

(a) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද, විභාග ගාස්තු ගෙවන ලද අංක ................................ .......................... සහ ................................................ වැනි දින දරන මුදල් කුවිතාන්සිය මෙයට අලවා ඇති බව ද ප්‍රකාශ කරමි.

(b) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(c) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

(d) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................ මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ........................................................................ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි.)

10.0 *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය* :

(දැනට රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සඳහා පමණක් මෙම කොටස අදාළ වේ.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................................................ මයා/මිය/මෙනෙවිය මෙම දෙපාර්තමේන්තුවේ ස්ථිර තනතුරක සේවය කරන බව ද, මෙම විභාග නිවේදනය ප්‍රකාරව මෙම තනතුර සඳහා අයදුම් කිරීමට අදළ සුදුසුකම් සපුරා ඇති බව ද, එම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කිරීමට හැකි බව ද සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

දිනය :————.

නම :————.
තනතුර :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි)

උපලේඛන අංක I

විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගරයන්

| නගරය | නගර අංකය | නගරය | නගර අංකය |
|---|---|---|---|
| කොළඹ | 01 | ත්‍රිකුණාමලය | 14 |
| ගම්පහ | 02 | මඩකලපුව | 15 |
| කළුතර | 03 | අම්පාර | 16 |
| මාතලේ | 04 | පුත්තලම | 17 |
| මහනුවර | 05 | කුරුණෑගල | 18 |
| නුවරඑළිය | 06 | අනුරාධපුර | 19 |
| ගාල්ල | 07 | පොළොන්නරුව | 20 |
| මාතර | 08 | බදුල්ල | 21 |
| හම්බන්තොට | 09 | මොණරාගල | 22 |
| යාපනය | 10 | කෑගල්ල | 23 |
| මන්නාරම | 11 | රත්නපුර | 24 |
| මුලතිව් | 12 | කිළිනොච්චිය | 25 |
| වවුනියා | 13 | | |

04-791

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා 2019/ 2020 අධ්‍යයන වර්ෂයට ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් බඳවා ගැනීමේ තරග විභාගය - 2018

කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීමේ තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සිංහල හා දෙමළ මාධ්‍යවලින් 2018 ජූලි මස තුළ ප්‍රධාන නගර කිහිපයක පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයන්හි පවත්වනු ලැබේ.

02. කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව

(2.1) කෘෂිකාර්මික දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලයන්හි කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව පවත්වා ගෙනයනු ලැබේ. පාඨමාලා කාලය වසර 2 1/2 කි. මෙය තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි කර ඇති පාඨමාලාවක් වන අතර, ඒ

සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 6 මට්ටම ලබා දේ.

(2.2) මෙම පාඨමාලාව ගැහැණු පිරිමි දෙපක්ෂයටම විවෘත වන අතර, මෙම තරග විභාගයෙන් සුදුසුකම් ලැබූ අය සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව කුසලතා හා දිස්ත්‍රික් පදනම මත අගුණකොළපැලැස්ස, කරපිංච, කුණ්ඩසාලේ, පැල්වෙහෙර සහ වව්නියාව යන කෘෂිකර්ම විද්‍යාල පහට තෝරා ගනු ලැබේ.

(2.3) සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙනුයේ සුදුසුකම් ලැබූ අයගේ සුදුසුකම්වල නිරවද්‍යතාව පරීක්ෂා කිරීම සඳහා පමණි.

(2.4) මෙම පාඨමාලාව පූර්ණ ලෙස ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

(2.5) මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමට කෘෂිකර්ම විද්‍යාලයක අවුරුදු දෙකක පුහුණුවෙන් පසු ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරියේ (NAITA) අධීක්ෂණය යටතේ මාස 06 ක රැකියාස්ථ පුහුණුවක් නම් කරන ලද ආයතනයකින් ලබා ගැනීම අනිවාර්ය වේ.

(2.6) කෘෂිකර්ම විද්‍යාලයේ පාඨමාලා පැවැත්වෙන කාලය තුළ නේවාසිකව සිටීම අනිවාර්ය වේ.

03. *පාඨමාලා සඳහා ඇතුළත් වීමට තිබිය යුතු සුදුසුකම්*

(3.1) අධ්‍යාපන සුදුසුකම්

(අ) අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ දී සිංහල/ දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට අනිවාර්යයෙන් සම්මාන හෝ ඊට ඉහළ සාමර්ථ ද, තවත් එක් විෂයයකට සම්මාන හෝ ඊට ඉහළ සාමර්ථයක් ද ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන හෝ ඊට ඉහළ සාමර්ථ්‍ය හතරකි.) දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයක් (06) සහිතව අ.පො.ස. (සා.පෙ) සමත් වී තිබිය යුතුය. මෙහි දී එක් වරක දී විෂයයන් තුනකට (03) සම්මාන සාමර්ථ්‍ය සහිතව අවම වශයෙන් විෂයයන් පහක් (05) සමත් වී තිබිය යුතුය. ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සමාර්ථයක් (S) තිබිය යුතුය.

සහ

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා විෂය ධාරාව තුළ ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් තුන හදරා අවම වශයෙන් එක් විෂයයක් සමත් වී තිබීම.

හෝ

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා විෂය ධාරාව තුළ ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව හා රසායන විද්‍යාව යන විෂයයන් තුන හදරා අවම වශයෙන් එක් විෂයයක් සමත් වී තිබීම.

හෝ

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී තාක්ෂණ වේදය විෂය ධාරාවේ ජෛව පද්ධති තාක්ෂණ වේදය, තාක්ෂණ වේදය සඳහා විද්‍යාව සහ කෘෂිකර්මය යන විෂයයන් තුන හදරා අවම වශයෙන් එක් විෂයයක් සමත් වී තිබීම.

හෝ

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී තාක්ෂණ වේදය විෂය ධාරාවේ ඉංජිනේරු තාක්ෂණ වේදය, තාක්ෂණ වේදය සඳහා විද්‍යාව සහ කෘෂිකර්මය යන විෂයයන් තුන හදරා අවම වශයෙන් එක් විෂයයක් සමත් වී තිබීම.

*වැදගත්* .- ජීව විද්‍යා සහ තාක්ෂණ වේදය විෂය ධාරාවන් යටතේ අ.පො.ස. (උසස් පෙළ) සඳහා උක්ත විෂය සංකලනවලට අදාළ විෂයයන් 3න් බැහැර වෙනත් විෂයයක් හදරා තිබුනහොත් එය නුසුදුසුකමක් ලෙස සැලකේ.

කෘෂිකර්ම විද්‍යාලවලට තෝරා ගැනීමේදී දිස්ත්‍රික් මට්ටමින් විෂයයන් තුනත් සමත් වී ඇති සිසුන්ට ප්‍රමුඛතාවක් ලබා දෙනු ලැබේ.

(3.2) 2018.05.21 වන දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 17 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 25 ට වැඩි නොවිය යුතුය. (ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 2001.05.21 දින හෝ ඊට පෙර හා 1993.05.21 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි)

(3.3) මෙය කෘෂිකාර්මික කටයුතුවලට අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් පාඨමාලාවකි. එබැවින් මේ සඳහා ඔබ තෝරාගතහොත් මෙම පාඨමාලාව හැදෑරීම සඳහා ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය සෞඛ්‍ය තත්වයකින් යුක්ත බවට රජයේ වෛද්‍යවරයකුගෙන් ලබා ගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

(3.4) පූජ්‍ය පක්ෂය මෙම පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් නොලබයි.

(3.5) රජයේ සේවයේ නියුතු අය මෙම තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

04. *පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම :*

(4.1) මෙම දැන්වීම අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය ප්‍රකාර අයදුම්කරුවන්ගේ අත් අකුරුවලින් හෝ යතුරු ලියනය කර හෝ පරිගණක ගත කර ගෙන 8" x 12" ප්‍රමාණයේ (A4) ප්‍රමාණයේ කඩදසියක දෙපැත්තම භාවිතා කරමින් තම අයදුම්පත සකස් කළ යුතුය. එම අයදුම්පත්‍රයේ අංක 01 සිට 09 තෙක් වූ ශීර්ෂ පළමු වන පිටුවට ද, අංක 10 සිට 14 තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද, ඉතිරිය 03 පිටුවට ද ඇතුළත් වන පරිදි අයදුම්පත්‍රය සකස් කළ යුතු අතර එය විභාගයට පෙනී සිටීමට ඉල්ලුම්කරන මාධ්‍යයෙන් සම්පූර්ණ කළ යුතු වේ. අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුවේ. එසේම නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත්‍රය දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත් කොට ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් වීම වැදගත් වේ. තවද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

(4.2) අයදුම්පත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන්ද බාගත හැක (www.doa.gov.lk) විභාග ගාස්තුව රු. 700/- කි. අයදුම්කරු විසින් මහජන බැංකුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ අංකː 057100179027204 දරන ගිණුමට විභාග ගාස්තු බැර කළ යුතුය. මුදල් බැරකර ලබාගන්නා ලදුපත, එහි එක් ධාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස අලවා එවීමට කටයුතු කළ යුතු වේ. (ගලවා ගැනීමට හැකි වන සේ). මෙම විභාග ගාස්තුවලට අමතරව වෙන කිසිදු අයකිරීමක් සිදුනොකරන බවද කාරුණිකව දන්වමි. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ. තවද විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු නොකෙරේ. මුදල් ගෙවා ලබාගත් ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීමට කටයුතු කළ යුතුය. විභාග ගාස්තු සඳහා වූ මුදල් ගෙවා ලබා ගත් ලදුපත අයදුම්පත්‍රය සමග ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත.

(4.3) සියලුම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් 2018 මැයි 21 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී ප්‍රමාද වන හෝ නැතිවන හෝ අයදුම්පත් ගැන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකීම් දරනු නොලැබේ.

(4.4) අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවර "2019/2020 කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත් වීම" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

05. *විභාග මධ්‍යස්ථාන :*

කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීමේ තරග විභාගය, විභාග දෙපාර්තමේන්තුව මගින් සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් 2018 ජූලි මස තුළදී පහත සඳහන් නගරවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පවත්වනු ලැබේ. විභාගය සඳහා ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

| න ග ර අංකය | නගරය |
|---|---|
| (1) | අනුරාධපුරය |
| (2) | බදුල්ල |
| (3) | මඩකලපුව |
| (4) | කොළඹ |
| (5) | ගාල්ල |
| (6) | යාපනය |
| (7) | මහනුවර |

| න ග ර අංකය | නගරය |
|---|---|
| (8) | කුරුණෑගල |
| (9) | මාතර |
| (10) | ත්‍රිකුණාමලය |
| (11) | වවුනියාව |
| (12) | රත්නපුර |
| (13) | හම්බන්තොට |
| (14) | කිලිනොච්චිය |

කිසියම් විභාග මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් විභාග අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති විට ඔවුන්ගේ දෙවැනි කැමැත්ත අනුව හෝ අයදුම් කොට ඇති මධ්‍යස්ථානයට සමීප වෙනත් විභාග මධ්‍යස්ථානයක් හෝ ඔවුන්ට නියම කෙරෙනු ඇත. විභාගය සඳහා ඉල්ලුම් කළ නගරය/ නගර පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. තවද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹදී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

06. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලදී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛනවලින් පමණක් ඕනෑම එකක් පිළිගනු ලැබේ.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත,

II. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

07. *විභාග ක්‍රමය :*

7.1 තරග විභාගය සඳහා වූ විෂයයන් හා කාල සටහන පහත සඳහන් වේ.

| *විෂයය* | *කාලය* |
|---|---|
| පළමු ප්‍රශ්න පත්‍රය (01) - කෘෂිකර්මය (ලකුණු 100 යි) | පැය 1 යි |
| දෙවන ප්‍රශ්න පත්‍රය (02) - බුද්ධි පරීක්ෂණය (ලකුණු 100 යි) | පැය 1 යි |

ඉහත විෂයයන් සඳහා විෂය නිර්දේශය පහත පරිදි වේ.

01. **කෘෂිකර්මය**
අ.පො.ස. (සා.පෙළ) කෘෂිකර්ම විෂය නිර්දේශ මට්ටම හා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පොදු විෂය කරුණු ආශ්‍රිතව සකස් කළ බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න අඩංගු වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

02. **බුද්ධි පරීක්ෂණය**
රටා, සබඳතා, පුරෝකථන, ගැලපීම්, විශ්ලේෂණ කුසලතා පිළිබඳ හැකියා ආදිය පරීක්ෂාවට ලක්වේ. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් යුක්ත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ.

7.2 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදයී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළග තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමට අදළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදනමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

7.3 අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

7.4 අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා විසින් හෝ ඔහු බලය පවරන ලද නිලධාරියෙකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු, විශ්‍රාමික නිලධාරියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුද අධිකාරිලත් නිලධාරියෙකු, රු. 240,360/- ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමින් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයෙකු හෝ ලවා, සහතික කරවා ගත යුතුය.

7.5 විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

7.6 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට අපේක්ෂකයන් හට සිදුවේ.

7.7 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සිසුන් ලබා ගත් ලකුණු ඔවුන්ගේ ලිපිනයන්ට දන්වා එවනු ඇත. මෙම ලිඛිත විභාගයට පෙනී සිටීමට ඉඩදීම මත හෝ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට කැඳවීම මත හෝ අදළ අයදුම්කරුගේ සුදුසුකම් පිළිගැනීමක් නොවන බව සැලකිය යුතුය. විභාගයට පෙර හෝ එය පවත්වන අතර හෝ ඉන් පසුව හෝ යන කවර

අවස්ථාවකදී වුවත් මෙම නිවේදනයේ කරුණු අනුව නුසුදුසු යයි තීරණය වන අයදුම්කරුවකුගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

7.8 ලිඛිත විභාගයට හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ ඒ දෙකටම හෝ පෙනී සිටීම වෙනුවෙන් රජය විසින් අයදුම්කරුවන්ට කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

08. *බඳවා ගැනීමේ ක්‍රමවේදය :*

8.1 බඳවා ගන්නා වර්ෂය තුළදී සියලුම කෘෂිකර්ම විද්‍යාලවලට බඳවා ගන්නා මුළු සංඛ්‍යාව පදනම් කර ගෙන අයදුම්කරුවන් සිටින දිස්ත්‍රික්කවලට ඇතුළත් කරගනු ලබන සංඛ්‍යාව තීරණය කරගනු ලැබේ. ඉන් පසුව දිස්ත්‍රික්කයට අයත් අයදුම්කරුවන් අතරින් තරග විභාගයේ පළමු හා දෙවන විෂයයන් දෙකේ ලකුණු එකතුව අනුව වැඩිම කුසලතාව පෙන්නුම් කළ අයදුම්කරුවන් හෝ අයදුම්කාරියන් තෝරාගනු ලැබේ. එසේ තේරීමේදී පහත සඳහන් කරුණුද සැළකිල්ලට ගනු ලැබේ.

8.2 දිස්ත්‍රික් පදනම සලකා බැලීමේදී අ.පො.ස. (සා.පෙළ) විභාගයට පළමුවන වරට පෙනී සිටි දිස්ත්‍රික්කය අයදුම්කරු හෝ අයදුම්කාරිය අයත් දිස්ත්‍රික්කය ලෙස සලකනු ලැබේ. අ.පො.ස. (සා.පෙළ) විභාගයට පළමුවන වරට පෙනී සිටි දිස්ත්‍රික්කයට අදළ අංකය සොයා අයදුම්පතේ අංක : 4 පිරවීම සඳහා මෙම *ගැසට්* නිවේදනයේ අවසානයට පළකර ඇති ඇමුණුම් අංක 01 උපයෝගී කරගත යුතුවේ.

8.3 ලිඛිත විභාගයේ කෘෂිකර්මය හා බුද්ධි පරීක්ෂණය යන විෂයයන් දෙකේ ලකුණුවල එකතුව අනුව වැඩිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් දිස්ත්‍රික් පදනමින් තෝරා ගෙන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ප්‍රතිඵල ලේඛනයේ දිස්ත්‍රික් කුසලතාවය ගණනය කිරීම සඳහා අයදුම්පත්‍රයේ අංක 5 යටතේ වූ තොරතුරු පදනම් කරගනු ලැබේ. එහිදී අ.පො.ස. (උ.පෙළ) ජීව විද්‍යා විෂයය ධාරාව හෝ තාක්ෂණවේදය විෂය ධාරාව හදරා විෂයයන් 03 කින් එකවර සමත් වූ හා තරග විභාගයේ විෂයයන් දෙකේ එකතුව අනුව වැඩිම ලකුණු ලබාගෙන කුසලතාවය දක්වූ අයට ප්‍රමුඛතාවය දෙමින් ඒ අය පළමුව තෝරා ගනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් එවැනි අයදුම්කරුවන් නොමැති විට හෝ එවැනි අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති විට දී පමණක් එම දිස්ත්‍රික්කවලින් තෝරා ගනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව සම්පූර්ණ වන සේ අ.පො.ස. (උ.පෙළ) විෂයයන් දෙකක් හෝ එකක් සමත් අයදුම්කරුවන් අතරින් තරග විභාගයේ විෂයයන් දෙක සඳහා වැඩිම ලකුණු ලබාගෙන කුසලතාවය දක්වූ අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ. මෙම තෝරා ගැනීම අනිවාර්යයෙන්ම 8.1 හා 8.2 හි සඳහන් ආකාරයට දිස්ත්‍රික්ක පදනමින් හා විභාගයේ දී දක්වූ කුසලතාව අනුව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් අනුමත කර ඇති ක්‍රමයක් අනුව සිදු කෙරේ. අදළ වර්ෂයේ දී එක් එක් කෘෂිකර්ම විද්‍යාලයට ඇතුළත් කරගනු ලබන පිරිමි හා ගැහැණු සිසුන් සංඛ්‍යාව එම විද්‍යාලවල පිරිමි හා කාන්තා නේවාසිකාගාරවල ඇති ඉඩකඩ අනුව හා එම විද්‍යාලවල ඇති පුහුණු පහසුකම් අනුව තීරණය කරනු ඇත. මේ නිසා තෝරා ගැනීමට සලකා බලන තරග විභාගයේ විෂයයන් දෙකේ ලකුණුවල එකතුවේ කඩඉම් ලකුණු මට්ටම් දිස්ත්‍රික්කයක පිරිමි හා ගැහැණු අයදුම්කරුවන් අතර වෙනස් වේ. කිසියම් දිස්ත්‍රික්කයක තෝරා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති විට දී විද්‍යාලවලට උපරිම සිසුන් ප්‍රමාණයක් ඇතුළත් කිරීම සඳහා අනිකුත් දිස්ත්‍රික්කවලින් අවශ්‍ය සිසුන් සංඛ්‍යාව තෝරා ගනු ලැබේ.

8.4 ඉහත සඳහන් කරුණු සලකා බලමින් තරග විභාගයේ විෂයයන් දෙකේ ලකුණු එකතුව අනුව වැඩිම ලකුණු සංඛ්‍යාවක් ලබාගත් සිසුන් සීමිත ප්‍රමාණයක්, එක් එක් දිස්ත්‍රික්කයකින් කැඳවා ඔවුන්ගේ අධ්‍යාපනික සහතික හා අදළ වෙනත් සහතික පරීක්ෂා කිරීමට සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. අයදුම්පතේ සඳහන් සහතිකවල මුල් පිටපත් මෙහිදී පරීක්ෂා කරනු ලැබේ. <u>සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබාදෙනු නොලැබේ.</u> කෘෂිකර්ම විද්‍යාලවලට තෝරාගනු ලබන සිසුන් සංඛ්‍යාවට වඩා වැඩි සිසුන් ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

09. "*කුසුමා ලක්ෂමී කරුණාතිලක*" සිහිවටන ශිෂ්‍යත්වය :

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ දී කෘෂිකර්මය, බුද්ධි පරීක්ෂණය යන ප්‍රශ්න පත්‍ර දෙකේ එකතුව අනුව වැඩිම ලකුණු ලබාගත් අයදුම්කාරියකට ඉහත ශිෂ්‍යත්වයේ කොන්දේසිවලට යටත්ව වර්ෂ දෙකක් සඳහා මෙම ශිෂ්‍යත්වය ප්‍රදනය කරනු ලැබේ. තෝරාගත් ශිෂ්‍යත්වලාභිනියට කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ඉගෙනුම ලැබීමට අවස්ථාව සලසා දෙනු ලැබේ. මෙම ශිෂ්‍යත්වයේ වාර්ෂික වටිනාකම රු. 10,000/- ක් වේ.

10. සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එච්. පී. දයාමැණිකේ සරත්චන්ද්‍ර,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් *වෙනුවට.*

2018 අප්‍රේල් මස 05 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.

ඇමුණුම් අංකඃ 01

දිස්ත්‍රික්කවල නම් හා ඒවාට අයත් අංක
(8.2 ඡේදයට අදළ වේ.)

| *දිස්ත්‍රික් අංක* | *දිස්ත්‍රික්කය* |
|---|---|
| 01 | අනුරාධපුරය |
| 02 | බදුල්ල |
| 03 | මඩකලපුව |
| 04 | කොළඹ |
| 05 | ගාල්ල |
| 06 | යාපනය |
| 07 | මහනුවර |
| 08 | කුරුණෑගල |
| 09 | මාතර |
| 10 | ත්‍රිකුණාමලය |
| 11 | වවුනියාව |
| 12 | රත්නපුරය |
| 13 | හම්බන්තොට |
| 14 | ගම්පහ |
| 15 | කළුතර |
| 16 | මාතලේ |
| 17 | නුවරඑළිය |
| 18 | මන්නාරම |
| 19 | මුලතිව් |
| 20 | අම්පාර |
| 21 | පුත්තලම |
| 22 | පොළොන්නරුව |
| 23 | මොණරාගල |
| 24 | කෑගල්ල |
| 25 | කිලිනොච්චිය |

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාවෙ 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට බඳවා ගැනීමේ තරග විභාගය - 2018**

**(Competitive Examination for Admission to Sri Lanka School of Agriculture – 2018 for Higher National Diploma in Agricultural Production Technology for Academic Year 2019/2020)**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

1.

| විභාගයට පෙනී සිටින නගරය | එහි අංකය |
|---|---|
| 1 වන තේරීම ................................ | ................................ |
| 2 වන තේරීම ................................ | ................................ |

(*ගැසට් පත්‍රයේ මුල් ඡේදයට අනුව*)

2. තරග විභාගයට පෙනී සිටීමට කැමති භාෂා මාධ්‍යය ඃ
සිංහල මාධ්‍ය - 2
දෙමළ මාධ්‍ය - 3

අදළ අංකය ඉදිරිපස කොටුව තුළ ලියන්න)

3. ස්ත්‍රී පුරුෂ භාවය ඃ

| | |
|---|---|
| පුරුෂ | 0 |
| ස්ත්‍රී | 1 |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

4. සා. පෙළ විභාගයට ප්‍රථම වරට පෙනී සිටි පාසල අයත්වන දිස්ත්‍රික්කය ඃ
..............................

(8.2 ඡේදයට අනුව/ඇමුණුම 01

දිස්ත්‍රික් අංකය
...............

5. අ. පො. ස. (උ.පෙළ) ජීව විද්‍යා විෂය ධාරාව /තාක්ෂණවේදය විෂය ධාරාව හදරා සමත් වී ඇති විෂයයන් ගණන (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

විෂයයන් තුනක් එකවර - 3
විෂයයන් දෙකක් හෝ එකක් එකවර - 2

සමත් වූ විෂයයන් ගණනට අදාළ අංකය

…………………

(3.1 ඡේදයට අනුව)

6. (*අ*) i. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :——————.
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDENA)

ii. අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-
(උදා: GUNAWARDENA H.M.S.K.) :——————.

iii. සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :——————.

7. i. ලිපිනය :——————.

ii. විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු :——————.
ලිපිනය :——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :——————.

iii. සම්බන්ධකර ගත හැකි දුරකථන අංක: i ස්ථාවර ☐☐☐☐☐☐☐☐☐☐

ii ජංගම ☐☐☐☐☐☐☐☐☐☐

8. (*අ*) අ.පො.ස. (සා.පෙළ) විභාගයට පළමු වරට පෙනී සිටි පාසල හා ලිපිනය :——————.
(*ආ*) පළමුවරට අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටි පාසල අයත් දිස්ත්‍රික්කය (සිංහලෙන්) :——————.

(*ඇ*) පළමුවරට අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටි පාසල අයත් දිස්ත්‍රික්කය (ඉංග්‍රීසියෙන්) :——————.

9. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

10. උපන් දිනය : අවුරුද්ද ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

11. 2018.05.21 වැනි දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

12. අධ්‍යාපන සුදුසුකම් (*ගැසට් නිවේදනයේ* සඳහන් විස්තර අනිවාර්යයෙන් කියවා මෙම කොටස පිරවිය යුතු වේ.)

(*අ*) *ගැසට්* නිවේදනයේ 3.1 ඡේදය අනුව අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සමත් විෂයයන් හය හෝ ඊට වැඩි ගණන :

| *විභාග අංකය* | *වර්ෂය සහ මාසය* | *සමත් විෂයයන්* | *විෂයය අංකය* | *සමත් ශ්‍රේණිය* |
|---|---|---|---|---|
| | | 1. සිංහල | | |
| | | 2. ගණිතය | | |
| | | 3. විද්‍යාව | | |
| | | 4. | | |
| | | 5. | | |
| | | 6. | | |
| | | 7. | | |
| | | 8. | | |
| | | 9. | | |
| | | 10. | | |
| | | 11. | | |

(*ආ*) අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාව/ තාක්ෂණ වේදය විෂය ධාරාව හදාරා ඇත් ද?

| | | |
|---|---|---|
| ජීව විද්‍යා විෂය ධාරාව | | (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න) |
| තාක්ෂණ වේදය විෂය ධාරාව | | |

(*ඇ*) අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් සමත් විෂයයන් :

| *විභාග අංකය* | *වර්ෂය සහ මාසය* | *සමත් විෂයයන්* | *විෂයය අංකය* | *සමත් ශ්‍රේණිය* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

(*ඈ*) ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් ඉල්ලුම් පත්‍රයට අමුණා එවන්න (මුල් පිටපත් එවිය යුතු නොවේ.)

13. දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය : ..........................................................................................................
(සිංහලෙන්) ..........................................................................................................

14. මුදල් කුවිතාන්සි විස්තරය :

14.1 මුදල් කුවිතාන්සිය නිකුත් කළ දිනය හා ශාඛාව : ..........................................................................................................

| |
|---|
| මුදල් කුවිතාන්සිය ගලවා ගත හැකි පරිදි මැලියම් ගා මෙහි අලවන්න. |
| එහි ඡායා පිටපතක් අනිවාර්යයෙන්ම ඔබ ළඟ තබාගන්න. |

අයදුම්කරුගේ ප්‍රකාශය :

මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති සියලුම විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මා අ.පො.ස. (සා.පෙළ) සමත් බවත් සිංහල, විද්‍යාව, ගණිතය යන විෂයයන්ට හා තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයයන් ඇති බවත් හා උසස් පෙළ ජීව විද්‍යාව විෂයය ධාරාව/ තාක්ෂණ වේදය විෂය ධාරාව හදාරා *ගැසට්* නිවේදනයේ නම් කර ඇති සියලුම සුදුසුකම් සපුරා ඇති බවටත් සහතික වෙමි. මෙහි සඳහන් කරුණු අසත්‍ය බව හෝ වැරදි බව හෝ හෙළි වුවහොත්, මා තරග විභාගයට පෙනී සිටීමට හා කෘෂිකර්ම විද්‍යාලයට තෝරා ගැනීමට නුසුදුස්සකු වන බව මම දනිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**අධ්‍යාපන සුදුසුකම් සහ අත්සන සහතික කිරීම**

(දෙපාර්තමේන්තුවක හෝ රජයේ පාසලක ප්‍රධානියෙකු, විශ්‍රාමික නිලධාරියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදා අධිකාරිලත් නිලධාරියෙකු රු. 240,360/- ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු විසින් මෙම අයදුම්පත්‍රය සහතික කළ යුතුයි.)

ඉහතින් අත්සන් කර ඇති ................................. මයා/ මිය/ මෙනෙවිය මා හොඳින් දන්නා හඳුනන බවත්, ඔහු/ ඇය මා ඉදිරිපිට දී අත්සන් යෙදූ බවත් මෙයින් සහතික කරමි. තවද *ගැසට්* නිවේදනයේ සඳහන් අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) සුදුසුකම් සපුරා ඇති බවට *ගැසට්* නිවේදනය හා අධ්‍යාපන සහතිකවල මුල් පිටපත් පරීක්ෂා කර බලා වගකීමකින් යුතුව සහතික කරමි. තවද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත මෙම ඉල්ලුම් පතෙහි අලවා ඇති බවත් සහතික කරමි.

———————————,
අත්සන
සුදුසුකම් සහතික කරන අයගේ නිල මුද්‍රාව.

දිනය :————.
නම :————.
නිල නාමය :————.
ලිපිනය :————.

හෝ ලවා, සහතික කරවා ගත යුතුය.

04 - 750

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.